නාවලපිටිය නගර සභාව.
මහනුවර දිස්ත්‍රික්කය

---

**1.** මූල්‍ය ප්‍රකාශන

**1.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන **2015** මාර්තු **27** දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන **2014** මාර්තු **26** දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව **2015** ජුලි **14** දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2** මතය.

මූල්‍ය ප්‍රකාශනවලින් **2014** දෙසැම්බර් **31** දිනට නාවලපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**1.3.1** ලැබිය යුතු ගිණුම්

**2014** දෙසැම්බර් **31** දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ **03** ක වටිනාකම රු.**63,687,046** ක් වූ අතර එයින් අවුරුදු **01** ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.**17,574,594** ක් වී තිබුණි.

**1.3.2** ගෙවිය යුතු ගිණුම්

**2014** දෙසැම්බර් **31** දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ **04** ක වටිනාකම රු.**67,007,173** ක් වූ අතර, එයින් රු.**15,355,421** ක් අවුරුදු **01** ට වැඩි ශේෂයකින් සමන්විත වී තිබුණි.

**1.3.3** නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). නගර සභා ආඥාපනත **159** (ඊ) වගන්තිය | අමාත්‍යවරයාගේ ලිඛිත අනුමැතියකින් තොරව රාමසාන් උත්සව සමය වෙනුවෙන් පවත්වන ලද උත්සවයේ සංග්‍රහ කටයුතු වෙනුවෙන් රු.**50,000**ක් වැයකර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| i. මු.රෙ. **372**(ආ) | කිසියම් කාර්යයක් සඳහා ලබාගන්නා අත්තිකාරම් අදාළ කාර්යය නිම වූ වහාම පියවීමට කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් **31** දිනට අවස්ථා **22** කදී ලබා දී තිබූ වර්ෂ **01** ත් **06** ත් අතර කාලයකට අදාළ රු.**33,400,712** ක අත්තිකාරම් පියවා නොතිබුණි. |

**ii.** **මු.රෙ. 756** | **සමාලෝචිත වර්ෂයේදී සභාව සතු වාහන සම්බන්ධව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.**

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වු ආදායම රු.5,801,779 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වු ආදායම රු.12,376,377 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,574,598 ක අඩුවීමක් දක්නට ලැබුණි.**

**2.2 විග්‍රහත්මක මූල්‍ය සමාලෝචනය**

**සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉකුත් වර්ෂයේ අතිරික්තය හා සමග සැසඳීමේදී රු.6,574,598 ක අඩුවීමක් නිරික්ෂණය වු අතර ඒ සඳහා 2014 වර්ෂයේදී ආදායම් විෂයයන් 02 ක ආදායම සියයට 10 සිට සියයට 30 ක පරාසයකින් අඩුවීමත් වියදම් විෂයයන් 03 ක වියදම සියයට 07 සිට සියයට 31 දක්වා වූ පරිසයකින් වැඩිවීමක් හේතු වි තිබුණි.**

**2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

**මුළු ජංගම වත්කම් සමග ජංගම වගකීම් පරික්ෂා කිරීමේදි ජංගම අනුපාතය 1.7.1 ක් ලෙස ප්‍රශස්ථ මට්ටමට වඩා අඩුවෙන් පවතින බව නිරික්ෂණය විය. ජංගම වත්කම් වලින් සියයට 53 ක් ආදායම් ණයගැතියන්ගෙන් සමන්විත වි තිබු අතර ජංගම වගකීම් වලින් සියයට 68 ක් කර්මාන්ත ණයහිමියන් බව නිරික්ෂණය විය.**

**2.4 ආදායම් පරිපාලනය**

**2.4.1 වරිපනම් බදු**

**පහත සදහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ) 2014 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.12,670,523 ක් වූ අතර, මෙයින් රු.4,110,440ක් වර්ෂ ගණනාවක සිට දුම්රිය දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතුව තිබුණි.**

**(ආ) සභාවේ දේපළ වර්ෂ 05කට වරක් තක්සේරුකර ඒ අනුව වරිපනම් බදු සංශෝධනය කළ යුතු වුවද, 2009 වර්ෂයේ තක්සේරුවට අනුව 2014 වර්ෂයේදිද බදු අයකර තිබුණි. 2009 වර්ෂයෙන් පසුව නාවලපිටිය නගරය සීඝ්‍රයෙන් සංවර්ධනය වී ඇති බැවින් 2014 වර්ෂයේදී වරිපනම් බදු සංශෝධනය නොකිරීම හේතුවෙන් සභාවට සැළකිය යුතු ආදායමක් අහිමිවී තිබුණි.**

**(ඇ) 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ගොඩනැගිලි අයදුම්පත් 106ක් සභාවෙන් අනුමත කර තිබුණද, අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ ගොඩනැගිලි 10කට පමණි. මේ අනුව නව ඉදිකිරීම්වලින් අයවිය යුතු වරිපනම් බදු විශාල ප්‍රමාණයක් සභාවට අහිමි වී තිබුණි.**

**2.4.2 බදු කුලී**

**(අ)** නාවලපිටිය බස්නැවතුම්පොල ඇතුලත කඩ කාමරවල මාසික කුලිය වර්ෂ 03කට වරක් තක්සේරු කළ යුතු වුවත් 2009 වර්ෂයේ සිට රු.1,500ක මාසික කුලියක් අයකරමින් පැවතුණි.

**(ආ)** ගම්පොල පාර නව කඩ 05න් 03ක් බිල්කර නොතිබූ අතර එම කඩ 05න් 2015 දෙසැම්ර් 31 දිනට රු.197,200ක මුදලක් හිඟව පැවතුණි.

**(ඇ)** මිලගණන් කැඳවීමකින් හා ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව ජයතිලක ක්‍රීඩාංගණයේ අවන්හළ ක්‍රීඩා සමාජයකට ලබාදී තිබූ අතර, එයින් 2014 දෙසැම්බර් 31 දිනට රු.101,510ක බදු කුළී හිඟයක් පැවතුණි.

**2.4.3 ප්‍රචාරක දැන්වීම් පුවරු**

සමාලෝචිත වර්ෂයේ දැන්වීම් පුවරු 183ක් වෙනුවෙන් අයකළ යුතු රු.707,338ක මුදලක් අයකරගෙන නොතිබුණි.

**2.4.4 වෙනත් ආදායම්**

ජයතිලක ක්‍රීඩාංගනයේ නේවාසිකාගාර ආපන ශාලාව මිලගණන් කැඳවීමෙන් තොරව පුද්ගලයෙකුට ලබාදී තිබුණු අතර නවාතැන් ගන්නා අයෙකුගෙන් ආහාර වේලක් සඳහා රු.20ක් සභාවට අය වියයුතුව තිබුණි. සපයන ලද ආහාර වේල් සම්බන්ධව විධිමත් ලේඛනයක් හෝ සභාවේ අධීක්ෂණයක් තිබූ බව නිරීක්ෂණය නොවූ අතර 2014 දෙසැම්බර් 31 දිනට රු.12,000ක හිඟයක් පැවැතුණි.

**2.4.5 ඉඩම් බදු**

සභාව සතු ඉඩම් කට්ටි 16ක් බදුදී තිබූ අතර එම බදු මුදල් 2008 වර්ෂයෙන් පසු තක්සේරු කර නොතිබුණි. මෙම බදුකරුවන් අතරින් දෙදෙනෙක් පමණක් 2014 වර්ෂයට බදු මුදල් වන රු.2,880ක් ගෙවා තිබූ අතර ඉතිරි බදුකරුවන්ගෙන් මුදල් අයකරගෙන නොතිබුණි. ඒ අනුව 2014 දෙසැම්බර් 31 දිනට සභාවට අයවිය යුතු මුළු මුදල රු.281,876ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනය

**(අ) අප ජලය පිරිසිදු කිරීම**

නාවලපිටිය නගර සභා පරිසර සංරක්ෂණ මධ්‍යස්ථානයේ එක් රැස්වන අපජලය නල මඟින් ජීව ප්‍රතික්‍රියකයක් වෙත යොමු කොට නියමිත රැඳවුම් කාලය අවසන්වූ පසු තෙත් බිම් වෙත යොමුකොට පිරිසිදු කිරීමෙන් පසුව පරිසරයට මුදාහැරීමේ ක්‍රමවේදයක් ස්ථාපිතකිරීම සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පරිසර ඉංජිනේරු විද්‍යාව පිළිබඳ කථිකාචාර්යවරයෙකු විසින් ඉදිරිපත් කරන ලද රු.260,000ක ඇස්තමේන්තුගත මුදලින් රු.104,000ක මුදලක් 2014 ජනවාරි 17 වෙනි දින ගෙවා තිබුණි. විගණන දිනවූ 2015 මාර්තු 30 වෙනි දින වනවිටද අදාළ කාර්යයන්ගේ ප්‍රගතිය සියයට 10 ක පමණ මට්ටමක පැවතුණි.

**(ආ). යෝජිත සිව්මහල් සාප්පු සංකීර්ණය ඉදිකිරීම**

පැරණි නගර සභා ගොඩනැගිල්ල පිහිටි ස්ථානයේ ඉදිකිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත්කර තිබූ සැලසුම සඳහා සංශෝධනයන් සිදුකර ගැනීමට කටයුතු නොකර ගෘහ නිර්මාණ ශිල්පියෙකුගේ සහය ලබාගෙන තිබුණ අතර, විනිවිද භාවයකින් තොරව ටෙන්ඩරයද පිරිනමා තිබුණි. ඒ අනුව අදාළ ගෘහ නිර්මාණ ශිල්පියා වෙත රු.1,000,000ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණද ඉදිරිපත් කර තිබූ සැලසුම නාගරික සංවර්ධන අධිකාරිය සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසිවලට අනුකූල නොවීම නිසා 2015 මාර්තු 20 දින වන විටත් ව්‍යාපෘතිය ආරම්භකිරීමට නොහැකිවී තිබුණි. එසේ තිබිය දී, මෙම ව්‍යාපෘතිය සඳහා පිළිවෙලින් 2013 වර්ෂයේදී හා 2014 වර්ෂයේදී රු.1,006,720ක් හා රු.1,054,104ක් බැගින් එකතුව රු.2,060,824ක මුදලක් මූලික කටයුතු වෙනුවෙන් වැයකර තිබුණි.

**3.2 හඳුනාගත් අලාභ**

2002 වර්ෂයේදී නාවලපිටිය බස්නැවතුම්පොල අසල පොදු වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම සඳහා ගිවිසුමකට එළැඹි ටෙන්ඩර්කරු අදාළ මුදල් ඇපකරයන්ද ඉදිරිපත්කර කොන්ත්‍රාත්තුවේ වැඩ ආරම්භකිරීමට භාරගැනීමෙන් පසුව කිසිදු සාධාරණ හේතුවක් නොදක්වා නගර සභාව විසින් ගිවිසුම අවලංගු කිරීම නිසා ටෙන්ඩර්කරු නීතිමය ක්‍රියාමාර්ගවලට එළඹ තිබුණි. මේ හේතුවෙන් අදාළ නඩුවේ නීතිඥ ගාස්තු ලෙස2005 වර්ෂයේ සිට තීන්දුව ලබා දුන් 2014 වර්ෂය දක්වා , රු.268,300ක මුදලක් සභා අරමුදලින් වැයකර තිබූ අතර අදාල නඩුවේ තීන්දුව අනුව පැමිණිලිකරුට රු.719,065ක මුදලක්ද ගෙවීමට සිදුවී තිබුණි.

**3.3 මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

නාවලපිටිය නගරයේ අනවසර එළවළු වෙළඳාමේ යෙදුණු වෙළඳුන් 08 දෙනෙකුට එරෙහිව නගර සභාව විසින් 2011 වර්ෂයේ පවරන ලද නඩු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට සභා අරමුදලින් රු.860,000ක් වැයවී තිබුණි. මෙම එක් නඩු වාරයක් සඳහා රු.40,000ක ඉහළ නීතිඥ ගාස්තුවක් ගෙවා නීතිඥවරයෙකුගේ සහය ලබාගෙන තිබුණ නමුත් 2014 දෙසැම්බර් 31 දින වන විටත් මෙම නඩු නිමවී නොතිබිණි.

**3.4 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

ප්‍රාදේශීය සභාව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ නිපදවන කොම්පෝස්ට් පොහොර අලෙවි කරන ලද ආයතනයකින් 2014 දෙසැම්බර් 31 දිනට සභාවට රු.389,950ක මුදලක් අයවිය යුතුව තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 සංයුක්ත සැළැස්ම**

සභාව සංයුක්ත සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.

**4.2 ප්‍රසම්පාදන සැළැස්ම**

රු.61,272,668ක ප්‍රාග්ධන වියදම් සභාව දරා තිබුණ නමුත් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.3 අයවැය පාලනය**

**-------------------**

**සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 03ක සියයට 20 සිට සියයට 34 දක්වාද වියදම් විෂයයන් 05ක සියයට 12 සිට සියයට 45 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.**

**4.4 අභ්‍යන්තර විගණනය**

**--------------------------**

**සමාලෝචිත වර්ෂයේදී සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.**

**4.5 විගණනය හා කළමනාකරණ කමිටු**

**---------------------------------------**

**සභාවේ සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.**

**5. පද්ධති හා පාලන**

**--------------------**

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ අවධානය යොමු කරනු ලැබේ.**

**(අ) ගිණුම්කරණය.**
**(ආ) අභ්‍යන්තර විගණනය**
**(ඇ) අයවැය පාලනය.**
**(ඈ) ආදායම් පරිපාලනය**
**(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය**